ප්‍රවාහන ව්‍යාපෘති සැකසීමේ පහසුකම් ව්‍යාපෘතිය - 2020

---

ප්‍රවාහන ව්‍යාපෘති සැකසීමේ පහසුකම් ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2016 ඔක්තෝබර් 28 දින එළඹි අංක 3425 එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ණය ගිවිසුම අනුව, එවකට වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය, වර්තමානයේ මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ශක්‍යතා අධ්‍යයනය, විස්තරාත්මක සැලසුම් සහ ප්‍රසම්පාදන ලේඛන පිළියෙල කිරීම සහ ව්‍යාපෘතිය ආරම්භක අදියර තුළදී ක්‍රියාත්මක කිරීමේ සහාය ලබා දීම මඟින් මාර්ග, දුම්රිය හා වරාය යන උප අංශවල ප්‍රමුඛතා ප්‍රවාහන ව්‍යාපෘතිවල ආරම්භක කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ව්‍යාපෘතියේ කටයුතු මාර්ග, දුම්රිය සහ වරාය යනාදි සංරචක තුන යටතේ ක්‍රියාත්මක කරනු ලැබේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 1,697.48 කට සමාන එ.ජ. ඩො මිලියන 11.34 ක් වන අතර ඉන් රු. මිලියන 1,496.90කට සමාන එ.ජ.ඩො. මිලියන 10ක් සැපයීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ඉතිරි මුදලවන රු. මිලියන 200.58 ශ්‍රී ලංකා රජය මූල්‍ය කිරීමට අපේක්ෂිතය. ව්‍යාපෘතිය එහි කටයුතු 2017 ජනවාරි 28 දින ආරම්භ කරන ලද අතර 2022 දෙසැම්බර් 31 දින වන විට නිමකිරීමට අපේක්ෂා කර තිබුණි.

## 1.3 තත්ත්වා ගණනය කළ මතය

---

මාගේ වාර්තාවේ 2.1 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණනය ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැලසීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

**1.6** **මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

**-------------------------------------------------------------**

**සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.**

**මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,**

- **වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.**

- **අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.**

- **භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.**

- **හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.**

**මාගේ විගණන කාලය තුළදී හඳුනාගනු ලබන අභ්‍යන්තර පාලනයේ වැදගත් අකාර්යක්ෂමතා ඇතුළුව අනෙකුත් කරුණු අතරින් වැදගත් විගණන සොයාගැනීම්, සම්බන්ධ පාර්ශවයන් සමඟ සන්නිවේදනය කරනු ලැබේ.**

**2.** මූලික ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

**2.1** ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩු | මුදල | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| | රු. මිලියන | | |
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 04 අනුව, ව්‍යාපෘතිය විසින් දරන මුළු පොළිය හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. කෙසේ වෙතත් පොළිය රු. මිලියන 06කට සමාන එ.ජ.ඩො. 40,434ක් පමණක් කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කර තිබුණි. | ව්‍යාපෘතිය විසින් හඳුනාගෙන නොමැත. | සියයට 02 පොළී ගණනය කිරීම ව්‍යාපෘතියට යොදා ගත නොහැක. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 04 (ණය ගැනුම් පිරිවැය) අනුව ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඉදිකිරීම් කාල පරිච්ඡේදය තුළදී උපදවන පොළිය ප්‍රාග්ධනිත කළ යුතුය. |
| (ආ) 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට අනුව ව්‍යාපෘතියේ සියළුම දේපල, පිරියත හා උපකරණ මාර්ග සංවර්ධන අධිකාරිය වෙත මාරු කර තිබුණද එය මූල්‍ය ප්‍රකාශනයේ සටහන්වල අනාවරණය කර නොතිබුණි. ඒ අනුව වර්ෂය සඳහා ක්ෂය ගිණුම් පොත්වලට ගෙන නොතිබුණු අතර මාර්ග සංවර්ධන අධිකාරියට මාරු කරන ලද වත්කම්වල ශේෂය නිවැරදිව දක්වා නොතිබුණි. | 1.82 | 2021 සඳහා මූල්‍ය ප්‍රකාශනවල මාර්ග සංවර්ධන අධිකාරිය වෙත මාරු කරන ලද වත්කම් නිසි පරිදි අනාවරණය කිරීමට පියවර ගනු ලැබේ. | මාර්ග සංවර්ධන අධිකාරිය වෙත මාරු කරන ලද වත්කම් ව්‍යාපෘති ගිණුම්වල වෙනම දැක්විය යුතු අතර ව්‍යාපෘතිය විසින් භාවිත කරන හා පාලනය කරන වත්කම්වල ක්ෂය ප්‍රාග්ධනිත කළ යුතුය. |
| (ඇ) ශ්‍රී.ලං.රා.අං.ගි.ප්‍ර. 03 හි 47 (අ) වගන්තිය අනුව පෙර වර්ෂයේ විනිමය ලාභය/අලාභය පෙර වර්ෂයේ ගැලපුම් ලෙස නිවැරදි කළ යුතුය. කෙසේවෙතත් එවැනි විනිමය ලාභය/අලාභය සමාලෝචිත වර්ෂයේ ගණුදෙණු ලෙස වාර්තා කර ඇත. | 3.77 | මෙම ව්‍යාපෘතිය ලාභ අරමුණු කරගත් ඒකකයක් නොවන නිසා මෙම ව්‍යාපෘතිය සඳහා එය ප්‍රමාණාත්මක වැරැද්දක් නොවන අතර එය ඇල්ම ඇති පාර්වශයන්ගේ තීරණ සඳහා ප්‍රමාණාත්මක බලපෑමක් නොවේ. | වර්තමාන වර්ෂයට ගැළපීමට වඩා අදාළ පෙර වර්ෂයට ගැලපීම් කළ යුතුය. |

**3.** **භෞතික කාර්ය සාධනය**

**3.1** **ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය**

**මේ දක්වා ව්‍යාපෘතිය විසින් නිම කිරීමට හඳුනාගත් වැඩ අයිතම්වලින් ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 338ක් වන උපදේශනය (තනි පුද්ගල)- අන්තර් ජාතික රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාර ප්‍රසම්පාදන උපදේශක සහ අධිවේගී මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යන අයිතම දෙක 2020 දෙසැම්බර් 31 වන විට නිම කර නොතිබුණි.**

**3.2.** **ඌන උපයෝගිතා සම්පත්**

| විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| ව්‍යාපෘති පරිපාලන අත්පොතට අනුව, මාර්ග සංරචකයේ ඇස්තමේන්තුගත පිරිවැය එ.ජ.ඩො. මිලියන 11.34ක් වන අතර ඉන් එ.ජ.ඩො. 10ක් ආ.සා.බැ විසින් සපයනු ලැබේ. ඉහත සපයන ලද තොරතුරු අනුව, 2020 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය විසින් එ.ජ.ඩො. මිලියන 7.41ක් උපයෝජනය කළ යුතුව තිබුණි.<br>කෙසේවෙතත්, එදින එ.ජ.ඩො. මිලියන 2.58ක් පමණ උපයෝජනය කර තිබුණි. | අධිවේගී සංවර්ධන සැලැස්ම සඳහා උපදේශන සේවාව මේ දක්වා ආරම්භ කර නොමැත. එමනිසා, ආ.සා.බැ. ණය යටතේ 2020 සඳහා වෙන්කරන ලද මුදල සම්පූර්ණයෙන්ම උපයෝජනය කළ නොහැකි විය. | • ව්‍යාපෘතිය අරමුදල් අපේක්ෂිත අරමුණ මත භාවිත කළ යුතුය.<br>• ව්‍යාපෘතියෙන් නියමිත කාලයට අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට නිසි පරිදි සැලසුම් කළ යුතුය. |